# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1794/7 - 2013 ජනවාරි මස 21 වැනි සඳුදා - 2013.01.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස — ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

*යොමු අංකය :* අම්/ඉ/2/7/30.
*ඉඩම් අමාත්‍යාංශ යොමු අංකය :* 4/3/3/2010/WS/179.

**ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි**

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වෙනි වගන්තියේ පළවෙනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර :-

හම්බන්තොට දිස්ත්‍රික්කයේ අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නැගෙනහිර ගිරුවාපත්තුව සුළු කොට්ඨාසයේ, රිදියගම ගමේ පිහිටි සර්වේ ජනරාල්ගේ 2012.08.28 දිනැති අ.ග.පි. 564 අතිරේක අංක 29 පත්‍ර අංක 27 දරන අවසාන ගම්පිඹුරේ කැබලි අංක 385 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.4698 ක් පමණ වන මහලකණ්ඩිය *නොහොත්* කිවුලේකැලේ නමැති පහත සඳහන් ඉඩම් කොටස :

කැබලි අංක - 385

| | | |
|---|---|---|
| ඉඩමේ නම | - | මහලකණ්ඩිය *නොහොත්* කිවුලේකැලේ |
| ඉඩම් පරිහරණය | - | විවෘත මුඩුබිම |
| හිමිකම් කියන අය | - | වේහැල්ල කන්කානම්ගේ දයානන්ද සහ වේහැල්ල කන්කානම්ගේ සිරිල් |
| ප්‍රමාණය | - | හෙක්ටයාර් 0.4698 |

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවේ හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලි වලින් බලයලත් අයවලුන් හෝ 2013.04.22 වැනි දින පූ.භා. 10.00 ට අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

1A - G 17179 — 345 (2013/01)

තවද, 2013.04.08 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් වල ස්වභාවයන් එකී ඉඩම/පරවශතාව ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරයත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

මාග්‍රට් පී. කුඹුරගේ,
ප්‍රාදේශීය ලේකම්,
අම්බලන්තොට.

2013 ජනවාරි 18 වෙනි දින,
අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

02 - 217

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.